විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2014

මගේ අංකය: විවැ/චක්‍රලේඛ/2014
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.
2014- 03- 25

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ ත්‍රිවිධ හමුදාපතිවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,

**වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා මනාපය පළකිරීම/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ සංශෝධන ක්‍රියාත්මක කිරීම**

1. 1983.08.01 දිනට ප්‍රථම විශ්‍රාම වැටුප් සහිත තනතුරකට පත්කරනු ලැබූ එදිනට සේවයේ නියුක්තව සිටි රාජ්‍ය නිලධාරිනියන් වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමයට ඇතුලත්වීම සඳහා මනාපය ප්‍රකාශකිරීමේ කාලය විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 2/2012 මගින් 2012.12.31 දක්වා දීර්ඝ කරන ලදී.

2. එහෙත් එම කාලය තුලද මනාපය ප්‍රකාශකිරීමට නොහැකි වූ නිලධාරීන් සඳහා මනාපය ප්‍රකාශකිරීමේ කාලය 2014.12.31 දක්වා දීර්ඝ කිරීමට අංක 1844/71 හා 2014 ජනවාරි මස 10 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මගින් විධිවිධාන සලසා ඇත.

3. ඒ අනුව පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

   i. 1983.08.01 දිනට රාජ්‍ය සේවයේ සෙවා නයුක්ත වූ නිලධාරිනියන් විසින් වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා මනාපය ප්‍රකාශ කිරීමට තීරණය කරනු ලැබිය හැක්කේ යම් දිනකට පෙරද එම දිනය 2014.12.31 ලෙසද,

   ii. නිලධාරිනිය විශ්‍රාම ලබා ඇත්නම් අයවිය යුතු හිඟ දායක මුදල් සහ පොළිය එකවර ගෙවිය යුතු බවද ,

   iii. නිලධාරිනිය මියගොස් ඇතිනම් අදාල දායක මුදල සහ පොළිය ගෙවනු ලබන ප්‍රදානයෙන් අඩුකල යුතු අතර, නිලධාරිනිය සේවයේ යෙදී සිටින්නේ නම් ඇය විශ්‍රාම යාමට පෙර මුළු දායක මුදල හා පොළිය අයකළ යුතු බවද,

   iv. දායක මුදල් අයකිරීම 2008.01.30 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/2008 හි විධිවිධාන වලට අනුකූල විය යුතු බවද,

   v. මෙම නියමයන් ශ්‍රී ලාංකීය පුරවැසිභාවය ඇති කැනැත්තියන්ට පමණක් සීමාවන බවද නියම කරමි.

4. පහත සඳහන් පුද්ගලයන්ට මෙම මනාපය ප්‍රකාශ කළ හැකිය.

i. දැනට සේවයේ යෙදී සිටින, 1983.08.01 දිනට පෙර පත්වීම් ලැබූ මනාපය ප්‍රකාශකිරීමට කැමති නිලධාරිනියන්.

ii. 1983.08.01 දිනට පසු විශ්‍රාම ලබා ඇති නිලධාරිනියන්.

iii. 1983- 08- 01 දිනට පසු විශ්‍රාම ලබා මනාපය පළකිරීමට දී ඇති අවසාන දිනයට පෙර මියයන නිලධාරිනියන්.
(මෙහිදි වැන්දඹු පුරුෂයාට හෝ අනත්දරුවන්ට හෝ අනත්දරුවන්ගේ භාරකරුවන්හට PD1A ආකෘති පත්‍රය අත්සන් කළ හැකිය.)

5. ඉහත 03 හා 04 ඡේදයන්හි සඳහන් කොන්දේසි වලට යටත්ව 2008 අංක 32 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් (සංශෝධන) පනතින් සංශෝධිත 1953 අංක 44 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතින් ආවරණය වන පාසල්වල පත්වීම් ලැබූ ගුරුවරියන්ට ද වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමයට මනාපය ප්‍රකාශ කළ හැක.

6. 2010 අංක 8 දරන වැන්දඹු හා අනත්දරු අරමුදල් (සංශෝධිත) පනතෙහි හා 2010 අංක 9 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනතෙහි සඳහන් විධිවිධාන වලට අනුකූලව මවිසින් නිකුත් කරන ලද අංක 13/2010 හා 2010.12.16 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛය කෙරෙහි අවධානය යොමු කරවමි. එහි සඳහන් 2010 අගෝස්තු 17 දිනට පෙර සිද්ධි සම්බන්ධයෙන් හිමිකම් පෑමේ දිනය 2014.12.31 දින දක්වා දීර්ඝකොට ඇත. මෙම නියමයන් 1970 අංක 18 දරන වැන්දඹු අනත්දරු (සන්නද්ධ හමුදා) පනත හා එහි සංශෝධන සහ 1998 අංක 60 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු (සන්නද්ධ හමුදා) පනත හා එහි සංශෝධන සම්බන්ධයෙන් ද බලපවැත්වේ.

එස්. එස්. හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. ලේකම් - රාජ්‍ය සේවා කොමිෂන් සභාව
05. විගණකාධිපති